**ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

-----------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභා කාර්යාලය පවත්වාගෙන යාම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් ඇප තැන්පතු ලෙස තබා තිබූ රු.1,424,400 ක මුදල 2021 වර්ෂය තුළ ගිණුම්ගත කර නොතිබුණි. | එම ප්‍රමාණය අත්තිකාරමක් ලෙස ගෙවූයේ නම් නොපිය වූ අත්තිකාරමක් ලෙස දිගින් දිගටම වර්ෂ අවසානයේදී ගිණුම්වල ඉතිරිව පවතින නිසා ඇප තැන්පතු මුදල 2021 වර්ෂය තුළ ගිණුම්ගත නොකිරීමට තීරණය කරන ලද බව. | ගොඩනැගිලි කුලී ඇප තැන්පතු මුදල කුලී හා වැඩ අත්තිකාරම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |

(ආ) දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් අයිතම 03 ක CIGAS ලේඛනය සමඟ භාණ්ඩාගාර මුද්‍රිත සැසඳීමේදී රු.90,500 සිට රු.751,320 අතර පරාසයක වෙනස්කම් පැවතුණි. | 2021 දී මිලදීගත් භාණ්ඩවල එකතුව භාණ්ඩාගාරයේ මූලික වත්කම්වල එකතුවට එකතු වී නොමැති බව නිරීක්ෂණය වූ බැවින් එය නිවැරදි කරන ලෙස භාණ්ඩාගාරයට දන්වා යවන ලදී. එය නිවැරදි කිරීමට ප්‍රමාදවීම මත මෙම වෙනස්කම් පවතී. මෙම වසර තුළදී භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | CIGAS ලේඛනය හා භාණ්ඩාගාර මුද්‍රිත සමඟ ගැළපෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතුය. |
| (ii) | කොමිෂන් සභාව විසින් 2021 වර්ෂය තුළ මිලදී ගෙන තිබූ රු.1,242,517 ක් වූ උපකරණවල අගය අවසන් ගිණුම් වාර්තාවේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ මිලදී ගැනුම් යටතේ (CIGAS ගිණුම් තුල) ඇතුළත් කර නොතිබුණි. | 2021 දී මිලදීගත් භාණ්ඩවල එකතුව භාණ්ඩාගාරයේ මූලික වත්කම්වල එකතුවට එකතු වී නොමැති බව නිරීක්ෂණය වූ බැවින් එය නිවැරදි කරන ලෙස භාණ්ඩාගාරයට දන්වා යවන ලදී. එය නිවැරදි කිරීමට ප්‍රමාදවීම මත මෙම වෙනස්කම් පවතින බව. | මිලදී ගනු ලබන වත්කම් අයිතම සියල්ල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2021 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් අපහරණය කර තිබූ පිරිවැය රු.2,405,140 ක් වූ ස්ථාවර වත්කම් අගය අවසන් ගිණුම් තුලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම අපහරණ වටිනාකම 2022 ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අපහරනය කරන ලද වත්කම්වල අගයන්, මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | වර්ෂ 2022 සිට අදාල ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) | **ඇප ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 891 (i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | වර්ෂ 2022 සිට අදාල ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ඇ) | **හානි පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | වර්ෂ 2022 සිට අදාල ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඈ) | **ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනය** | | |
| | 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | වර්ෂ 2023 සිට ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනය සකස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කර තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වැය විෂයන් 04 කට අදාළ රු.3,140,564 ක් උපයෝජනය නොකර ඉතිරිවී තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක විය. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 තත්ත්වය මත ඇති වූ නොවැළැක්විය හැකි හේතු මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | වෙන් කර ඇති ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කර ගන්නා ප්‍රතිපාදන කිසිදු අවස්ථාවක ඉතිරිවීම් සිදු නොකර අදාළ කාර්යයයෙහි සම්පූර්ණ වශයෙන් උපයෝජනය කළ යුතු වුවත් වැය විෂයයන් 02 කට අදාළව එකතුව රු.2,014,500 ක ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එය සියයට 92 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 තත්ත්වය මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද කිරීමට සිදු වීමත් ඇණවුම් කරන ලද භාණ්ඩ සැපයීමට සැපයුම්කරුවන් අපොහොසත් වීමත් මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වූ බව. | වෙන් කර ඇති ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට හා සැකසුරුවම්ව සහ කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට ද විශේෂයෙන් වගබලා ගත යුතු වුවද වැය විෂයයන් 12 ක මූලික ඇස්තමේන්තුව සියයට 25 සිට සියයට 1000 දක්වා පරාසයක සංශෝධනය කර තිබුණි. | 2021 වර්ෂයේදී සිදු කිරීමට නියමිත කාර්යයන් සඳහා වසර මුලදී ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මෙම මූලික ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදු වූ බව. | ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයට අදාළව එකතුව රු.100,185 ක් වටිනා බැරකම් අයිතම 06 ක් 2021 වර්ෂයේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි. | ප්‍රමාද දෝෂයක් මත එම බැරකම් 2021 ගිණුම් තුල ඇතුළත් කිරීමට නොහැකි වූ බව. | ගිණුම් කාල පරිච්ඡේදයට අදාළ සියළුම බැරකම් එම ප්‍රකාශයේ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | 2021 වර්ෂයේ කොමිෂන් සභාව සතු සංචිත වාහන 3 කට අදාලව මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | උක්ත කාර්යය කාලීනව සිදු කර ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මේ අරමුණුවල ඇතුළත් ප්‍රධාන ක්‍රියාකාරකම් 03 ක් යටතේ දක්වා තිබූ උප ක්‍රියාකාරකම් 25 ක් අතුරින් උප ක්‍රියාකාරකම් 08 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම්වලට අදාළ මූලික කටයුතු සිදු කළ ද එවකට පැවති කොවිඩ් වාතාවරණය හේතුවෙන් හා විටින් විට පැන නැගුණු සංචරන සීමාවන්, නිරෝධායන ඇඳිරි නීති තත්ත්වයන් මත මෙම කාර්යයන් ප්‍රමාද කිරීමට සිදු විය. | සැළසුම්ගත කාර්යයන් උපරිම වශයෙන් ඉටු කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතු අතර පවතින තත්ත්වය යටතේ ක්‍රියාත්මක කළ හැකි කාර්යයන්ට අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රය වර්ග අඩි 10,000 කින් යුක්ත මාසික කුලිය රු. 650,000 ක්වූ නුගේගොඩ පිහිටි ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් තිබුණි. එහෙත් 2021 ජූලි 01 දින සිට මාසික කුලිය 1,424,400 ක් වන වර්ග අඩි 4748 කින් යුක්ත වූ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයෙහි කොමිෂන් සභා කාර්යාලය ස්ථාපිත කිරීම හේතුවෙන් වාර්ෂිකව රු.7,184,596 ක අමතර වැයක් දැරීමට සිදුවී තිබුණි. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අංක 126, නාවල පාර, නුගේගොඩ යන ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාමේදී මුහුණ පෑමට සිදු වූ විවිධ දුෂ්කරතාවයන් හේතුවෙන් සහ අතිගරු ජනාධිපතිතුමන්ගේ දැක්ම පරිදි සියලු රාජ්‍ය ආයතන රාජ්‍ය ගොඩනැගිලිවල ස්ථාපනය කිරීමට කටයුතු කරන ලෙසට ආයතන ප්‍රධානින්ගෙන් සිදු කළ ඉල්ලීම පරිදි වෙනත් සුදුසු ආයතන පරිශ්‍රයකට මෙම ආයතනය රැගෙන යාම පිළිබඳව සළකා බලන ලදී.<br>පසුව BMICH පරිශ්‍රයේ බදු දීම සඳහා පවතින ඉඩකඩ පිළිබඳව දැන ගැනීමට ලැබුණු හෙයින් පැරණි කාර්යාල පරිශ්‍රයේ මුහුණ දීමට සිදු වූ ප්‍රධාන ගැටලුවලින් තොරව කාර්යාලය පවත්වාගෙන යාමට හැකි වීම හේතුවෙන් BMICH පරිශ්‍රයේ කාර්යාලය ස්ථාපනය කිරීමට තීරණය කළ බව. | සේවා ගිවිසුම්වලට එළඹීමේදී වෙළඳපලේ පවතින තරඟකාරී මිල දර්ශනයන් සැලකිල්ලට ගෙන වඩාත්ම ඵලදායී හා වාසි සහගත සේවා ගිවිසුම්වලට එළඹීමට කළමනාකරණය තීරණ ගත යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව කොමිෂන් සභාව විසින් දැනුවත් වී, කොමිෂන් සභාවට අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනා ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ලඟා කර ගැනීම මැන බැලීම සඳහා වන නිර්ණායක අදාල වන්නේ මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් වන හෙයින් මෙම ආයතනය ඒ සම්බන්ධයෙන් දර්ශක හඳුනාගැනීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි. ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන් හිදී මෙම අරමුණු පිළිබඳව අවධානය යොමු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි. | කොමිෂන් සභාව අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන්හී දී මූලිකත්වය ගෙන ක්‍රියාකරන ආයතනය බැවින් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

## 5. යහපාලනය

------------

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු වෙනුවෙන් වෙනම ඒකකයක් ස්ථාපිත නොකර අධ්‍යාපන අමාත්‍යංශය යටතේ විගණන කටයුතු සිදුකර ගෙන යනු ලබන අතර සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ රැස්වීම් එක් වාරයක් පමණක් පවත්වා තිබුණි. | පැවති අයහපත් සෞඛ්‍යය වාතාවරණය මත 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී ඇති බව. | රේඛීය අමාත්‍යාංශයේ විගණන අංශය හරහා අභ්‍යන්තර විගණන කර්තව්‍ය ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩල සැලැස්ම තුළ ඇති ගණකාධිකාරී, වැඩ සටහන් නිලධාරි (මුදල්) හා සංවර්ධන නිලධාරි යන තනතුරු වෙනුවෙන් පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමකින් තොරව වසරකට වැඩි කලක සිට වැඩබැලීමේ පත්කිරීම් සිදු තිබුණි. | සියලු බඳවා ගැනීම් නවතන ලෙසට ලද උපදෙස් ප්‍රකාරව කටයුතු කර ඇති බව. | පුරප්පාඩු ඇති වූ වහාම බඳවා ගැනීම් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |